**ශීර්ෂය 229- නීතිපති දෙපාර්තමේන්තුව**

---------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

නීතිපති දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපතිදෙපාර්තමේන්තුවේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 16දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කරතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සංස්ථා අංශය විසින් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නෛතික ගාස්තු සඳහා බිල් කල ආදායම රු.78,319,557 ක් වූ අතර ඉන් රු.31,537,787 ක් අය කරගෙන තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම රු.46,781,770 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල (ACA – 1(1) ) හිඟහිටි ආදායම ලෙස රු.46,154,860 ක් දක්වා තිබූ බැවින් එදිනට හිඟ ආදායමේ රු.626,910 ක වෙනසක් විය. | 2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සංස්ථා අංශය විසින් ගාස්තු සඳහා මුළුබිල්කල ආදායම රු.78,319,557කි. සමාලෝචිත වර්ෂය තුළ රු.32,164,697 ක් අය කරගෙන ඇති අතර ඒ අනුව හිඟහිටි ආදායම රු. 46,154,860 කි. | අයකරගෙනතිබූහිඟආදායමේනිරවද්‍යතාවය තහවුරු වී තිබිය යුතුවේ. |
| (ii) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙහි ACA 1(i) ආකෘතියෙහි පසුගිය වසරට පෙර වසර සඳහා හිඟ ආදායම් ශේෂය දැක්වීමේ දී පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ශේෂය හා සමාලෝචිත වසර ආරම්භයේ පැවති ශේෂය අතර රු.12,311,617 ක වෙනසක්වූ අතර ඒ සඳහා හෙළිදරව් කිරීම් ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයට පෙර වර්ෂයන්හි බිල් කරන ලද නමුත් අතපසු වීමකින් ගිණුම් ගත වී නොතිබූ බිල්පත් කිහිපයක් ගිණුම් ගත කර අදාල ශේෂය නිවැරදි කිරීම මෙම වෙනසට හේතු වී ඇත. | ඉකුත් වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂ පෙර වර්ෂයට අදාල අනුරූපී ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒ ඒ වැය විෂයයන්වලට අයත් වියදම් ඒ ඒ වැය විෂයයන්වලටම ගිණුම්ගත කල යුතු වුවද සම්මත වැය විෂයයන්ට අයත් නොවන එකතුව රු.6,869,252 ක වියදම් (මාරු පත්‍ර මඟින් සිදුකල ගැලපීම්වලින් පසුව) සාවද්‍ය ලෙස වෙනත් වැය විෂයයන්වල සටහන් කර ඇතිබව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ | • පරිගණක යන්ත්‍ර අළුත්වැඩියා හා නඩත්තු වියදම්යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පුනරුත්ථාපනය(2002) වැය විෂයය යටතේ ගිණුම් ගත කර ඇත.<br>• නව නිල නිවාසයට ගෘහභාණ්ඩ, අනෙකුත් ගෘහ උපකරණ (කොට්ට, කොට්ට උර, අත් | ඒ ඒ වැයවිෂයයන්වලට අයත්වියදම්අදාලවැයවිෂයන්වලට නිවැරදිව ගිණුම්ගතකලයුතුවේ. |

| | | |
|---|---|---|
| අතර ඒ අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ 2 (i), ඒසීඒ 2(ii) ඒසීඒ 3 (iii)හි සඳහන් වියදම්වල සාවද්‍ය තත්ත්වයක් පෙන්නුම් කෙරුණි. | පිස්නා, පාපිසි ආදී දේ) මිලදී ගැනීම් වෙනත් පුනරාවර්ථන වියදම් (229-01-01-0-1409)යටතේ රු.188,568 ක් ද ලිබඩු මිලදී ගැනීම් (229-01-01-0-2102) යටතේ රු. 1,000,000 ක් ද, වෙනත් උපකරණ මිලදී ගැනීම්(229-01-01-0-2103) යටතේ රු. 1,408,360 ක් ද ගිණුම්ගත කර ඇත.<br>• සංස්ථා අංශයේ රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් නීති හා අනෙකුත් නිලධාරීන්ට සංයුක්ත දීමනා හා ගමන් වියදම් එම අංශයේ විදුලි බිල් වියදම්229-1-1-3-1409 (සංස්ථා අංශය) වැය විෂය යටතේ නිවැරදිව ගිණුම් ගත කර ඇත. | |

### 1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක් එක් ණයගැතියන්ගෙන් අයකර ගෙන තිබූ ශේෂය හඳුනා ගත හැකිවන පරිදි හිඟ අදායම් අය කිරීමේ උපලේඛණයක් ඉදිරිපත් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.57,241,617 ක හිඟ ආදායම් අයකිරීම්වල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | හිඟ ආදායම් අයකිරීම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා උචිතලේඛන පිළියෙල කරතිබිය යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ආදායම් අයකර ගැනීමේ දුර්වලතා**<br>සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයට අදාල හිඟ ආදායම රු.75,591,785 ක් වූ අතර ඉකුත් වර්ෂයට පෙර වර්ෂයට අදාල හිඟ ආදායම රු.245,551,757ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ අයකිරීම් | රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල නීතිමය කටයුතු සඳහා අදාල බිල්පත් එම ආයතන වෙත නියමිත පරිදි යොමු කලද ගෙවීම් සිදු කිරීම ප්‍රමාද වන බවක්පෙනේ.ඒවා රජයේ ආයතන බැවින් අවශ්‍ය නීතිමය කටයුතු අඛණ්ඩව සිදු කරනු ලබන අතර ගාස්තු අය කර ගැනීම කඩිනම් | හිඟ හිටි ආදායම් කාල ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| පිළිවෙලින් රු.40,039,787ක් හා රු.17,201,830ක් වූ අතර එය හිඟ හිටි ආදායමෙන්සියයට 52 ක් සහ සියයට 7 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ හිඟහිටි ආදායම රු.310,056,785 ක් විය. | කිරීම සඳහා වරින්වර ලිපි සහ දුරකථන මාර්ගයෙන් සිහි කැඳවීම් සිදු කෙරේ. | |
| **(ආ) ආදායම් තත්ත්වයන් කලින් කලට සමාලෝචනය නොකිරීම**<br>---------------------------------------<br>2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව පවතින ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් සේවාවන් සඳහා අය කරනු ලබන ගාස්තු එම සේවාවන් සැපයීම සඳහා වන වියදම් සැලකිල්ලට ගනිමින් කාලානුරූපීව සංශෝධනය කල යුතුය. කෙසේ වෙතත් නීතිපති දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂය සඳහා රු.78,319,557 ක ආදායමක් (බිල්කල ආදායම) රැස්කර ගැනීම සඳහා විශේෂිත කාර්යමණ්ඩල වැටුප් හා ප්‍රසාද දීමනා නීති නිලධාරීන්ට ගෙවන විශේෂ දීමනා,ප්‍රසාද දීමනා ලිපිද්‍රව්‍ය ඇතුළු වියදම් සඳහා රු.89,982,869 ක වියදමක් දරා තිබූ බව දෙපාර්තමේන්තු ආදායම් ලෙජර හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව තහවුරු විය. | පවතින ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සේවා සඳහා අයකරන ගාස්තු සංශෝධනයක් පිළිබඳව මෙම වර්ෂය තුලදී අවධානය යොමු කරනු ඇත. | ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අයකරනු ලබන සේවා ගාස්තු කලින්කලට සමලෝචනය කල යුතු වේ. |

**2.2 වියදම් කළමනාකරණය**

-------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු සකස් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ත පුනරාවර්තන වැය විෂයන් 19 කින් පුනරාවර්තන වැය විෂයන් 05ක් සහ එක් මූලධන වැය විෂයයක් වෙත සලසා තිබුණු | දෙපාර්තමේන්තුව සඳහා ඉදිකෙරුණු නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය, නීතිපති නිල මැදිරියට අවශ්‍ය ලීබඩු මිලදී ගැනීමට, එම ගොඩනැගිල්ල තුල මෙහෙයුම් කටයුතු ඇරඹීම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, විදුලිය හා ජලය යනාදී | සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව පූර්වානුමාන කල හැකි සියළුම සේවාවන් ඇතුලත් කර |

| | | |
|---|---|---|
| රු.40,300,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයන් 03ක් සහ එක් මූලධන වැය විෂයක් වෙත මාරු කර තිබුණි.. | පුනරාවර්ථන වියදම් වෙනුවෙනුත්, අවශ්‍ය ප්‍රතිපාදන 2021 අයවැය ඇස්තමේන්තුවලට ඇතුලත් කලද ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුණු බැවින් එම වියදම් පියවා ගැනීම සඳහා ප්‍රතිපාදන ඉතිරිවූ වැය විෂයන්ගෙන් ප්‍රතිපාදන මාරු කර ගන්නා ලදී. විගණකාධිපති සම්පිණ්ඩන වාර්තා කෙටුම්පතෙහි සඳහන් කර ඇති පරිදි තවදුරටත් වඩාත් තාත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | තාත්විකව හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කල යුතු වේ. |

**2.3** **බැරකම් හා බැඳීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන III) හෝ භාණ්ඩාගාරයේ බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවේ (SA 92 හි) බැරකම් කිසිවක් සටහන් කර නොතිබූ නමුත් අවස්ථා 26 ක් යටතේ වූ රු.9,008,408 ක බැරකම් සඳහා 2022 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. | මෙමසියළුගෙවීම් 2022 ජනවාරි මස ලැබුණු බිල්පත්වලට අදාල ගෙවීම් වේ. සෑම මාසයකම විදුලිය හා ජලය, දුරකථන, අතිකාල, අන්තර්ජාල පහසුකම් හා ආරක්ෂණ සේවා සඳහා ගෙවීම් සිදු කෙරෙනුයේ අදාල මාසය ඉකුත්වීමෙන් පසු ඊලඟමාසයේදීය. | ඉදිරි වර්ෂයේ ගෙවීමට ඇති සියළුම බැරකම් පිළිබඳ විස්තර බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් කල යුතු වේ. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකසමාජවාදීජනරජයේමුදල්රෙගුලාසිසංග්‍රහය | | | | |
| (i) මුදල් රෙගුලාසි 104(1) අ | – | මෝටර් වාහන හදිසි අනතුරු 33 ක් සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් හෝ පවත්වා නොතිබුණි. | 2021-11-15 දිනෙන් පසු සිදුවූ සියලුඅනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකරගෙන යනු ලබයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ii) මුදල් රෙගුලාසි 232(2) | - | වවුචර් පත් වල වටිනාකම අකුරෙන් හා ඉලක්කමෙන් දැක්විය යුතු වුවත් ගෙවීම් වවුචර්පත් බොහොමයක ගෙවන මුදල අකුරෙන් දක්වා නොතිබුණි. | ප්‍රමාද දෝෂයකින් සමහර වවුචර්වල ගෙවන මුදල අකුරෙන් සටහන් කිරීම මගහැරී ඇත. ඉදිරියේදී එවැනි අඩුපාඩු සිදු නොවන ලෙසට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (iii) මුදල් රෙගුලාසි 237 | - | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේ දී ගෙවීම් වවුචරයේ අදාල භාණ්ඩ ලැබී ඇති බවට හා අදාල බඩු ලේඛණයේ තොග පොත් යනාදියේ ඇතුලත් කල බවට සහතිකයක් අමුණා නොතිබුණි. | ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී ගෙවීම් වවුචරයේ අදාල භාණ්ඩ ලැබී ඇති බවට හා අදාල ලේඛණයන්හි ඇතුලත් කල බවට සහතිකයක් ඇමිණීම අනිවාර්යයෙන් සිදු කෙරෙන අතර එවැනි අතපසුවීමක් සිදු වී ඇත්නම් එය නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වමි. | - එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **(iv)** මුදල් රෙගුලාසි 273 | 550,015 | මෝටර් වාහන අළුත්වැඩියාවන් 07 කට අදාලව කාර්මික නිලධාරියකුගේ සහතිකයක් ලබා ගැනීමෙන් තොරව ගෙවීම් කර තිබුණි. | 2021 මැයි මස සිට මුදල් රෙගුලාසි 273 ප්‍රකාරව කාර්මික නිලධාරීගේ සහතිකය මත පමණක් ගෙවීමකිරීමට කටයුතු කරනු ලබයි. | - එම - |
| | (v) මුදල් රෙගුලාසි 1642 | - | සමාලෝචිත වර්ෂය තුල සිදු වී තිබුණු මෝටර් වාහන අනතුරු 33 කදී පොලිසියට වාර්තා කර නොතිබුණි. | හදිසි අනතුරට අදාලව වන්දි ගෙවීමේදී රක්ෂණ සමාගම් විසින් පොලිස් වාර්තාවක් කැඳවනු ලබන අවස්ථාවන්හිදී පමණක් දැනට පොලිසිය වෙත වාර්තා කරනු ලබන අතර ඉදිරියේදී සිදුවන සියලුඅනතුරු සම්බන්ධයෙන් පොලිසිය වෙත වාර්තා කරන ලෙස නිලධාරීන් හා රියදුරන් දැනුවත් කර ඇත. | - එම - |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | _ | දෙපාර්තමේන්තුව සතු වාහන 101 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | වාහන හිමිකම ඇති නිලධාරීන් වෙත පවරා දී ඇති වාහන සඳහා දෙපාර්තමේන්තුවෙන් ඉන්ධන සැපයීමක් සිදු නොකෙරෙන බැවින් ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු නොකෙරේ. දෙපාර්තමේන්තුවෙන් ඉන්ධන සපයනු ලබන සංචිතයේ පවතින සියළුම වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කරනු ලබයි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ඇ) | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | | |
| | 4.2.2 වගන්තිය | | ප්‍රසම්පාදන කටයුතු ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරනතුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි විස්තර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතු වේ. |

**2.5 තැන්පතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දින චෙක්පත් මගින් විවිධ සැපයුම් හා සේවා සඳහා ගෙවීම් කරන බව ගෙවීම් වවුචර්වල සඳහන් කරමින් වැය විෂයයන් හර කර චෙක්පත් ලියා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රජයේ මුදල්වලට අදාල රු.27,271,695 ක චෙක්පත් 07 ක් මාස 08 කට වැඩි කාලයක් දෙපාර්තමේන්තුව තුල රඳවා තබාගෙන 2021 අගෝස්තු සහ දෙසැම්බර් මාසවල පොදු තැන්පත් ගිණුමට බැරකරතිබුණි. 2021.12.31 දින වන විටත් මෙම ගෙවීම් සිදු කර නොතිබුණි. | අනුරාධපුර අධිනීතිඥ නිල නිවසෙහි ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව උතුරු මැද පලාත් ප්‍රධාන ඉංජිනේරුවරයා නමින් රු.10,650,000 ක චෙක්පතක් ලියා තිබුනද, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ නොවූ බැවින් චෙක්පත නිදහස් නොකරන ලදී. පසුව චෙක්පත කල් ඉකුත්වූ බැවින් එය අවලංගු කර පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගන්නා ලදී.<br><br>දෙපාර්තමේන්තුව සඳහා ඉදිකෙරුණු නව ගොඩනැගිල්ලට අවශ්‍ය ලීබඩු උපකරණ මිලදී ගැනීම සඳහා ගෙවීම් කිරීමට චෙක්පත් ලිවීම සිදු කලද, අදාල භාණ්ඩ නියම පිරිවිතරයන්ට අනුව සපයා ඇති බවට උපදේශක ආයතනයෙන් නිර්දේශ ඉදිරිපත් නොවූ බැවින් අදාල මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගන්නා ලදී. | සැපයුම් හෝ සේවාවක් ලබා නොගත් වවුචර් සඳහා ගෙවීම් නොකල යුතු වේ. |

**3. මෙහෙයුම්සමාලෝචනය**

**3.1 සැලසුම්සහවාර්ෂිකවාර්තා**

**(අ) ක්‍රියාකාරි සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්මේ 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඇතුලත් කළයුතු ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත නිමවුම් මට්ටම ඇතුලත් කර නොතිබුණි. | 2021 වර්ෂය සඳහා ඔබ වෙත එවා ඇති ක්‍රියාකාරී සැලැස්ම තුල ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරම් හා අපේක්ෂිත නිමැවුම් මට්ටම් ඇතුලත් කිරීම අතපසුවීමකින් මගහැරී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතු වේ. |

**(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2ප්‍රකාරවරාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරවසමාලෝචිත වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණන මතය ලද වහාම කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක්විගණනය සඳහා ඉදිරිපත් කරන බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල යුතු වේ. |

**3.2 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයට උපරිම වාසියක් ලැබෙන පරිදි ගෙවීම් කිරීමට ගණන්දීමේ නිලධාරියා කටයුතු කලයුතු වුවද කුලී පදනමට ලබා ගෙන තිබූ ගොඩනැගිල්ලක් සඳහා විදුලි බිල්පත් ගෙවීමේ දී මාසික විදුලි පරිභෝජන වියදමට අමතරව එකතුව රු.143,964 ක් වූ අධිභාරගෙවීමක් සිදු කර තිබූ බව2021 ජනවාරි සිට මැයි දක්වා ගෙවීම් වවුචර් පරීක්‍ෂාවේ දී නිරීක්ෂණය විය. | කුලී පදනමටලබාගත් ගොඩනැගිල්ලක බදු ගිවිසුමේ තිබූ ප්‍රමාදයක් හේතුවෙන් එකී ගොඩනැගිල්ලට අදාල විදුලිබිල ගෙවීමේදී ඇතිවූ ගැටළුකාරී තත්වය නිරාකරණය කර ගන්නා තෙක් ගෙවීම ප්‍රමාද වීම නිසා අමතර පොලී මුදලක් ගෙවීමට සිදු විය. ඉදිරියේදී මෙවැනි තත්වයන් පාලනය කර ගනිමින් රජයට සිදුවන අවාසිදායක තත්වයන් වලක්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | රජයට මූල්‍ය අවාසියක් සිදු නොවන පරිදි රජයෙන් කරන ගෙවීම් කිරීමට කටයුතු කල යුතු වේ. |

**3.3 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොවිඩ් වසංගත තත්ත්වයේ බලපෑම නිසා රට ආර්ථික වශයෙන් දැඩි අර්බුදකාරී තත්ත්වයන්ට පත්ව රාජ්‍ය ආදායම් ලබා ගැනීම දැඩි සීමාකාරී තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක වෙමින් තිබිය දී සමාලෝචිත වර්ෂය තුල නීතිපති දෙපාර්තමේන්තුව | නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, විවිධ රාජ්‍යආයතනවල උසස් නිලධාරීන්, විවිධ රටවල තානාපතිවරුන්, සමග සම්මුඛ සාකච්ජා හා රැස්වීම් පැවැත්වෙන බැවින් ඔවුන් සඳහා සහ විශේෂ අවස්ථාවන්හිදී රජයේ විශේෂිත කාර්යයන් සඳහා නීතිපති හමුවීමට පැමිණෙන විදේශ නීතිපතිවරුන් | රටේ පවතින ආර්ථික තත්ත්වය සලකා බලා රාජ්‍ය වියදම් දැඩි සකසුරුවම් සහගත ලෙස යෙදවීමට |

| | | |
|---|---|---|
| විසින් පවත්වන ලද කෙටි රැස්වීම්, සාකච්ඡා සඳහා සංග්‍රහ වියදම් ලෙස රු.4,023,840 ක් වැය කර තිබුණි. | හා ඔවුන්ගේ නියෝජිතයින් සඳහා සංග්‍රහ සහ භෝජන සංග්‍රහයන් පැවැත්වීමට සිදුවන බැවින් දැඩි අර්බුදකාරී තත්වයන් යටතේ වුවද අදාල සංග්‍රහ වියදම් දැරීමට සිදු විය | කටයුතු කල යුතු වේ. |

**3.4** **කළමනාකරණදුර්වලතා**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 177 (I) ප්‍රකාරව දෛනිකව රැස්කරනු ලබන ආදායම කාලප්‍රමාදයකින් තොරව රජයේ ආදායමට බැර කළයුතු වුවද, නීතිපති දෙපාර්තමේන්තුවේ දෛනිකව රැස්කර තිබූ ආදායම රජයේ ආදායමට ගිණුම් ගත කිරීම දින 07 ත් දින21 ත් අතර කාල පමාවකින් පසුව සිදු කර තිබුණි. | ඉදිරියේදී මුදල් රෙගුලාසි 177 (1) ප්‍රකාරව රැස් කරන ආදායම් කාලප්‍රමාදයකින් තොරව රජයේ ආදායමට බැර කිරීම සඳහා සුදුසු පියවර ගනු ලබන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රාජ්‍ය ආදායම් කාල ප්‍රමාදයකින් තොරව රාජ්‍ය ආදායමට බැර කල යුතු වේ. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සුළු මුදල් අග්‍රිමයෙන් එකවර ගෙවීමේ දී රු.5,000 ක සීමාව නොඉක්මම විය යුතු වුවත් මන්නාරම රජයේ අධිකරණ නිල නිවස සඳහා වූ රු.20,000 ක සුළු මුදල් අග්‍රිමයෙන් රු.5,000ට වැඩි වියදම් සඳහා අවස්ථා 03 කදී එකතුව රු.38,600 ක් ගෙවීම් සිදු කර තිබුණි. | හදිසි අවශ්‍යතා මත අවස්ථා 03 කදී මෙම ගෙවීම් කර තිබුණි. ඉදිරියේදී සුළුමුදල් අග්‍රිමයෙන් එවැනි ගෙවීම් සිදු නොකිරීමට වග බලා ගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයේදී රට තුල පැවති කෝවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල වරින් වර වසා තැබීමට සිදු වීමත්, පරිපාලන නිලධාරී තනතුරු 03 ක පුරප්පාඩු පැවතීමත් හේතුවෙන් 2021 වර්ෂය සඳහා විධිමත් මානව සම්පත්සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමට නොහැකි විය. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිලියෙල කල යුතු වේ. |
| (ආ) ශ්‍රී ලංකා රජය රජයේ ආයතන සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියළුම නෛතික සේවාවන් සහ නීති උපදෙස් නොපමාව සැපයීම සහ රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ දී සුවිශේෂි කාර්යන් සඳහා දායක වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වලට අදාල මුළු කාර්ය මණ්ඩලයෙන් 305ක එනම් සියයට 58ක පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම දෙපාර්තමේන්තු කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපා තිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුවේ පැරණි ගොඩනැගිල්ලේ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොතිබීම නිසා අදාල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නොහැකි විය. අලුතෙන් ඉදි කරනු ලැබූ නව ගොඩනැගිල්ල විවෘත කිරීමත් සමග අදාල පුරප්පාඩු වලින් කොටසක් පිරවීම සඳහා නිලධාරීන් බඳවා ගනු ලැබූ අතර වර්තමානයේ රට තුල පවතින ආර්ථික අර්බුදය හමුවේ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අනුව නව නිලධාරීන් බඳවා ගැනීම අසීරු වී ඇත. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාලව කාර්ය මණ්ඩල බඳවා ගැනීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කල යුතු වේ. |